# කුරුණෑගල ඇතාගල කඳුවැටිය හා සබැඳි ඓතිහාසික ජනප්‍රවාද හා ලිඛිත සාධක පිළිබඳ අධ්‍යයනයක්

**දිල්රුක්ෂි ඩී.එම්.ටී.**[1]

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙන ඇතෙකුගේ හැඩය ගත් ඇතුගල හෙවත් ඇතාගල බොහොම ප්‍රසිද්ධියට පත් ස්ථානයකි. ඇතාගල පිළිබඳව අධ්‍යයනය කරන විට එහි ඉතිහාසය විජය රජුගේ රාජ්‍ය කාලය දක්වා දිවෙයි. ඇතාගල සම්බන්ධයෙන් පවතින එක් ජනප්‍රවාදයක් නම් ඒ අසල පිහිටා තිබෙන ඉබ්බාගල, එළුගල, කුරුම්ණියාගල, ආඳාගල ආදී සත්ව හැඩය නිසා නම්පට බැඳුනු පර්වත සහ කුවේණිය සමඟ බැඳේ. විජය රජු විසින් නෙරපා හරින කුවේණිය ඉතාමත් දුකින් සහ විශාල කෝපයකින් යම් ශාපයක් සිදුකළ බවත් ඒ ශාපය සිදුකළ ස්ථානයේ රැඳී සිටි ඇතෙක්, කුරුම්ණියෙක්, ඉබ්බෙක්, එළුවෙක් සහ ආඳෙක් ගල් පර්වත හැඩයට පරිවර්තනය වූ බවත් මේ ජනප්‍රවාදයේ සඳහන් වේ. ජනප්‍රවාද හා කුරුණෑගලට සම්බන්ධ ඉතිහාසය පිරික්සීමේදී ඇතාගලේ පිහිටා තිබුණා යැයි සැලකෙන දේවානම්පියතිස්ස රජු විසින් කරවූ බව සඳහන් ඇතුගල විහාරය පිළිබඳ කතාපුවත හඳුනාගත හැකිය. ඇතාගල පිහිටා තිබෙන පොකුණ වනවාසී භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා හෝ රාජකීය පරිහරණය සඳහා ඉදිවූවක් යැයි සැලකේ. ඇතාගල සම්බන්ධ තවත් ජනප්‍රවාදයක් ලෙස වත්හිමි කුමාරයා සම්බන්ධ ජනප්‍රවාදය පෙන්වාදිය හැකිය. තුන්වන විජයබාහු රජුට මුස්ලිම් ජාතික බිසවකට දාව උපන් කුමාරයා මේ වත්හිමි කුමරු බවත් ජනප්‍රවාදයේ එයි. තුන්වන විජයබාහු රජුගේ ඇවෑමෙන් රාජ්‍යයත්වයය පත්වුණු කුමාරයාට සිංහල අමාත්‍යවරුන්ගෙන් හොඳ ප්‍රතිචාරයක් ලැබී නැත. ඒ සඳහා ඔහුගේ අසාධාරණ ප්‍රතිපත්ති හා බෞද්ධ විරෝධි ක්‍රියාපිළිවෙත හේතු වූ බව කියවේ. ඒ හේතුවෙන් ඇතාගල මුදුනේ පිරිත් සජ්ඣායනාවක් කරවා පිරිත් ශ්‍රවණය කරන අතරතුර කුමාරයා සිටි මණ්ඩපය හෙල පහළට වැටෙන්න සලස්සවා ඔහුව ජීවිතාක්ෂයට පත් කරන්න මේ පිරිස සමත් විය. වත්හිමි කුමාරයාගේ සිරුර ඇතාගල පාමුලට වැටුන බව ජනප්‍රවාදයේ එයි. ඇතාගල කඳුවැටිය පාමුල ඇත්කඳ විහාරය පිහිටා තිබේ. මහාවංශය, පූජාවලිය, රසවාහිනිය වැනි ග්‍රන්ථයන්හි ඍජුවම නම සඳහන් වන කුරුණෑගල ඇති එකම විහාරස්ථානය මෙයයි. රසවාහිනියේ එන මලියදේව මහ රහතන් වහන්සේ හා සුළුගුලු උපාසක සම්බන්ධ කතාවේ ද ඇත්කඳ විහාරය පිළිබඳ සඳහන් වේ. මෙසේ ඇතාගල කඳුවැටිය හා සබැඳි ඓතිහාසික ජනප්‍රවාද හා ලිඛිත සාධක අධ්‍යයනයෙන් ඇතාගල හා තදාශ්‍රිතව ඇති තවත් ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ස්ථාන වන ඇත්කඳ විහාරය, ගලේ බංඩාර දේවාලය, රාජ මාළිගය, දළදා මැදුර ආදී බොහෝ ස්ථාන පිළිබඳ තොරතුරුද හෙළි වේ.

**ප්‍රමුඛ පද :** ඇතාගල, වත්හිමි කුමරු, ඇත්කඳ විහාරය, ජනප්‍රවාදය, ඉතිහාසය

[1] thakshila.dilrukshi716@gmail.com